# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
## காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
## LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැඳුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகதமெதுர", காணிச் செயலகம், 1200/6, ராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretariat, 1200/6, Rajamalwatta Road, Battaramulla.


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>MY NO | 4/1/චක්‍රලේඛ/2012 | ඔබේ අංකය<br>உமது இல<br>YOUR NO | | දිනය<br>திகதி<br>DATE | 2012. 10 . 18 |

**චක්‍රලේඛ අංක : 2012/06**

**සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරු සහ ප්‍රාදේශීය ලේකම්වරු**

**<u>විශේෂ ආයෝජන ව්‍යාපෘති සඳහා රජයේ ඉඩම් ලබා දීම කඩිනම් කිරීම</u>**

**පසුබිම:**

රජයේ සංවර්ධන ප්‍රමුඛතා අනුව විවිධ ක්ෂේත්‍රවල ආයෝජන ව්‍යාපෘති සඳහා ඉදිරිපත් වන දේශීය හා විදේශීය ආයෝජකයින් ට රජයේ ඉඩම් ආඥා පනතේ ප්‍රතිපාදන යටතේ රජයේ ඉඩම් ලබා දිමට අවශ්‍ය වන අවස්ථා වල දී ඒ සඳහා අනුගමනය කරනු ලබන සංකීර්ණ ක්‍රියා පටිපාටිය තුල අධික කාලයක් ගත වීමත් ඒ ඇතැම් ආයෝජකයින් අධෛර්යයට පත්වීමත් කෙරෙහි යොමු කරමින් ආයෝජකයින් සමග කඩිනමින් බදු ගිවිසුම් වලට එළඹීමට හැකි වන සේ සරල ක්‍රමවේදයක් සකස් කරන ලෙස මා වෙත උපදෙස් දීමට 2012.08.08. දින අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර ඇත. මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ද එකඟත්වය ඇතිව විශේෂ ආයෝජන ව්‍යාපෘති සඳහා රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීර්ඝ කාලීන බදු ක්‍රමය යටතේ යම් ආයෝජකයකු වෙත ඉඩම් ලබා දීමේ දී හෝ එවැනි ආයෝජකයින් සඳහා ඉඩම් බදු මත ලබා දීමේ පරමාර්ථයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය වැනි ආයතනයකට දීර්ඝ කාලීන බදු ක්‍රමයට හෝ දීමනාපත්‍රයක් මගින් ඉඩමක් ලබා දීමේ දී හෝ පවත්නා නීති රීති වලට අනුකූලව පහත සඳහන් කඩිනම් ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීම සුදුසු බවට තීරණය කර ඇත. මින් ඉදිරියට එම ක්‍රියා පටිපාටිය එවැනි ව්‍යාපෘති සඳහා ඉඩම් ලබා දීමේ දී අනුගමනය කරන මෙන් කාරුණිකව දන්වමි. විදේශීය ආයෝජකයින් සඳහා ඉඩම් ලබා දීමේ දී බදු ක්‍රමය යටතේ මිස පූර්ණ අයිතිය හිමිවන දීමනාපත්‍රයකින් පැවරීම ප්‍රතිපත්තියක් වශයෙන් සිදු නොකිරීමට ද තීරණය කර ඇති බව සලකන්න.


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| [illegible] | 011-2797400 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 011-2864051 | වෙබ් ලිපිනය<br>இணையம்<br>Web Address | www.landcommdept.gov.lk | ඊමේල්<br>ஈ-மெயில்<br>E-mail | landcom@landcommdept.gov.lk |

## විශේෂ ආයෝජන ව්‍යාපෘති සඳහා ඉඩම් ඉල්ලීම් ලෙස ගැනෙන අවස්ථා :

මෙම උපදෙස්වලට අදාල වන විශේෂ ආයෝජන ව්‍යාපෘති ලෙස පහත සඳහන් වර්ගවල ආයෝජන ව්‍යාපෘති සැලකිල්ලට ගත යුතුයි.

1. යම් ආයෝජන ව්‍යාපෘති සඳහා යොදා ගැනිම පිණිස නාගරික සංවර්ධන අධිකාරියට, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියට, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට, ශ්‍රී ලංකා වරාය අධිකාරියට බදු මත හෝ දීමනා පත්‍ර මත ඉඩම් පැවරීම සඳහා ඉල්ලීම්.

2. අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත විදේශීය හෝ දේශීය පුද්ගලික ආයෝජන ව්‍යාපෘති සඳහා ඉඩම් ඉල්ලීම්.

3. ආයෝජන ව්‍යාපෘති සම්බන්ධයෙන් ක්‍රියා කරන කර්මාන්ත අමාත්‍යාංශය, විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශය වැනි අමාත්‍යාංශයක් හෝ රාජ්‍ය ආයතනයක් විසින් නිර්දේශ කර යොමු කරනු ලබන පුද්ගලික දේශීය හෝ විදේශීය ආයෝජන ව්‍යාපෘති සඳහා ඉඩම් ඉල්ලීම්.

4. අවස්ථානුකූලව ප්‍රමුඛතාවය ලබාදිය යුතු ආයෝජන ව්‍යාපෘතියක් ලෙස ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් නිගමනය කරනු ලබන වෙනත් ආයෝජන ව්‍යාපෘති සඳහා ඉඩම් ඉල්ලීම්.

## විශේෂ ආයෝජන ව්‍යාපෘති සඳහා ඉඩම් ලබා දීමේ කාර්ය පටිපාටිය:

### I. 1 වැනි පියවර - ඉල්ලීම් ලැබීම:

විශේෂ ආයෝජන ව්‍යාපෘති සඳහා සුදුසු ඉඩමක් තෝරාගෙන ඇත්නම් ඒ සඳහා ඉල්ලීම ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කල යුතුයි. එවැනි ඉල්ලීම් සෘජුව ආයෝජකයා විසින් හෝ ආයෝජන ව්‍යාපෘතියට පහසුකම් සපයන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය , ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය වැනි ආයතනයක් මගින්ද ඉදිරිපත් කල හැක. ඒ සමග අදාල අමාත්‍ය මණ්ඩල තීරණය හෝ ආයෝජන මණ්ඩල අනුමැතිය දී ඇති බවට ලිපි වැනි ප්‍රතිපත්තිමය තීරණ වලට අදාල ලේඛන වල පිටපත්ද ඉදිරිපත් කළ යුතුයි.

ආයෝජකයා විසින් සුදුසු ඉඩමක් සොයා ගැනිම සඳහා අපගෙන් විමසීම් කරන අවස්ථාවකදී එසේ ලබා දීමට හැකි ඉඩම් පිළිබඳ තොරතුරු එක්රැස් කර ඉදිරියේදි එම තොරතුරු ලබා දීමට අපේක්ෂා කෙරේ.

## 111 3 වැනි පියවර -නිර්දේශ වාර්තා සකස් කර ඉදිරිපත් කිරීම

මෙම කමිටුව, අවශ්‍යතාවය අනුව නිකර රැස්වී ඉදිරිපත්ව ඇති ඉල්ලීම් සම්බන්ධයෙන් නිර්දේශ වාර්තා සකස් කිරීමට අදාල කටයුතු සැලසුම් කිරීමත් කඩිනමින් ක්‍රියාත්මක කරමින් අවශ්‍ය පියවර ගත යුතුය. ඉල්ලීමක් ඉදිරිපත් වූ විට සතියක් ඇතුලත ව්‍යාපෘති වාර්තාවේ කරුණු අධ්‍යයනය කර ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කිරීමට පියවර ගත යුතු වේ.

සංයෝජක හෝ ආයෝජකගේ නියෝජිතයෙකු කමිටුවේ කටයුතු සඳහා සහය වීමට ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සහභාගි කරවා ගත හැකිය. ව්‍යාපෘති වාර්තාවේ පිටපත් අවශ්‍යතාවය පරිදි කමිටු සාමාජිකයින් වෙත යොමු කළ යුතු වේ.කමිටුවේ ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා ප්‍රවාහන ආදී පහසුකම් සැපයීම පිණිස අදාල ආයෝජන ව්‍යාපෘති වලට පහසුකම් සපයනු ලබන රාජ්‍ය ආයතනය විසින් හැකි සෑම අවස්ථාවකදීම පියවර ගනු ඇත.

අදාල ආයතන වෙතින් ලබා ගත යුතු නිර්දේශ වාර්තා ගෙන්වා ගැනීම වෙනුවට එම ආයතන නියෝජනය කරනු ලබන මෙම කමිටුවේ නිළධාරීන් විසින් එකඟතාවය ලබා දීම තුළින් ප්‍රාදේශීය ලේකම් විසින් ඉදිරිපත් කළ යුතු නිර්දේශ වාර්තා මෙම කමිටුව විසින් සකස් කර මෙම දෙපාර්තමේන්තුවේ නියෝජිතයා මගින් මා වෙත ඉදිරිපත් කළ යුතුයි.මෙම නිර්දේශ වාර්තාවෙහි එක් පිටපතක් පළාත් ඉඩම් කොමසාරිස් වෙත එම නියෝජිතයා මගින් ලබා දිය යුතුයි.

ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් කමිටුවේ සහභාගීත්වය තුළින් ලබා ගන්නා තොරතුරු මත අදාල ඉඩමේ සැලැස්මක් සකස් කර මා වෙත එවිය යුතුයි .එම සැලැස්මේ පිටපතක් ප්‍රධාන තක්සේරුකරු වෙත යවන අතර කමිටුවේ ක්‍රියාකාරීත්වය තුළින් ලබා ගන්නා තොරතුරු සහ එම සැලැස්ම අනුව ඉඩම තක්සේරු කර වාර්තාවක් ප්‍රාදේශීය ලේකම්ට පිටපතක් සහිතව මා වෙත එවීමට ප්‍රධාන තක්සේරුකරු ක්‍රියා කරනු ඇත.

## IV 4 වැනි පියවර - පළාත් සභාවේ එකඟතාවය ලබා දීම

නිළධාරී කමිටුව විසින් පළාත් ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කරනු ලබන නිර්දේශ වාර්තා පිටපත සහ පළාත් ඉඩම් කොමසාරිස්ගේ නියෝජිතයා විසින් කමිටුවේ සහභාගීත්වය තුළින් ලබා ගන්නා තොරතුරු පදනම් කරගෙන පළාත් ඉඩම් කොමසාරිස් විසින් අදාල ඉඩම අදාල ව්‍යාපෘතියට පැවරීම සඳහා වූ පළාත් සභාවේ එකඟත්වය ලබා ගෙන මා වෙත දැන්විය යුතුයි.

## V 5 වැනි පියවර - මැනුම් ඉල්ලීමක් යැවීම

නිර්දේශ වාර්තා ලැබීමෙන් පසුව ඉඩම මැන නියමිත වර්ගයේ රේඛා චිත්‍රයක් එවන ලෙස අදාල ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත ප්‍රාදේශීය ලේකම්ට සහ පළාත් ඉඩම් කොමසාරිස්ට පිටපත් සහිතව මෙම දෙපාර්තමේන්තුවෙන් යවනු ලැබේ. ඒ අනුව ඉතා කඩිනමින් රේඛා චිත්‍රය මා වෙත එවීම සඳහා ඉහළ ප්‍රමුඛත්වයක් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## VI 6 වැනි පියවර - ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයට නිර්දේශ යැවීම .

ඉහත 5 පියවරට සමගාමීව දීර්ඝ කාලීන බදු හෝ දීමනා පත්‍ර සඳහා ගරු ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා එම අමාත්‍යාංශයේ ලේකම් වෙත නිර්දේශ කර ලිපි ගොනුවද සමග ඉදිරිපත් කෙරේ. දීමනාපත්‍රයක් මත ලබා දෙන්නේ නම් අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය සඳහා අමාත්‍යතුමා ගේ නිර්දේශය සමග ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් යවනු ලැබේ. පළාත් ඉඩම් කොමසාරිස්ගේ නිර්දේශය මේ අවස්ථාව වන විට ලැබී නොමැති නම් එම නිර්දේශය ලබා ගැනීමට යටත්ව මේ පියවරෙහි කටයුතු ඉටු කරනු ලැබේ. අනුමැතිය ලබා ගැනීමෙන් පසු ගැසට් නිවේදනය පළ කරනු ලැබේ.

**II. <u>2 වැනි පියවර - නිර්දේශ වාර්තා සකස් කිරීම සඳහා නිළධාරී කමිටුවට යොමු කිරීම.</u>**

දැනට පවත්නා ක්‍රියාපටිපාටිය අනුව අදාල ප්‍රාදේශීය ලේකම් විසින් විවිධ සම්බන්ධ ආයතනවලින් නිර්දේශ ගෙන්වාගෙන පළාත් ඉඩම් කොමසාරිස් වෙත නිර්දේශය යවා පළාත් ඉඩ කොමසාරිස්ගේ පරීක්ෂාකිරීම් වලින් හා සමහර අවස්ථා වල පළාත් සභාවේ අනුමැතිය ද ලබා ගෙන නිර්දේ වාර්තා මා වෙත එවීමට දීර්ඝකාලයක් ගත වේ. එබැවින් මෙවැනි විශේෂ ව්‍යාපෘති වලට අදාලව මූලික නිර්දේ වාර්තා සකස් කිරීම සඳහා පහත සඳහන් සංයුතියෙන් යුත් කමිටුවක් පිහිටුවනු ලැබේ.

නිර්දේශ වාර්තා කමිටුව විසින් ඒකාබද්ධව සකස් කර පළාත් ඉඩම් කොමසාරිස්ට පිටපත සහිතව මා වෙත ඉදිරිපත් කිරීම සඳහා මෙම කමිටුවට අයදුම්පත යොමු කරනු ලැබේ.

i. ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ නියෝජිතයෙකු
ii. පළාත් ඉඩම් කොමසාරිස්ගේ නියෝජිතයෙකු
iii. ප්‍රාදේශීය ලේකම්
iv. දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී
v. ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී
vi. අදාළ පළාත් පාලන ආයතනයේ නියෝජිතයෙකු
vii.නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජිතයෙකු
viii.ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නියෝජිතයෙකු
ix. සංචාරක සංවර්ධන අධිකාරියේ නියෝජිතයෙකු
x. තක්සේරු දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xi. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xii. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xiii. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xiv. වන ජීවී දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xv. අවස්ථානුකූලව අදාල විය හැකි වෙනත් ආයතන වල නියෝජිතයින්

මෙම කමිටුවේ සම්බන්ධීකරණ නිලධාරියා ලෙස ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ නියෝජි කටයුතු කළයුතු අතර එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව අදාල ආයතන වල නියෝජිතයින් ස ඇතිව නම් කළ හැකි අවස්ථාවලදී එම විස්තර මා විසින් ලබාගෙන එම නියෝජිතයින් අවශ්‍යතාවය ඇ සම්බන්ධ කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

**VII. 7 <u>වැනි පියවර - ඉඩමට තක්සේරු වාර්තා කැඳවීම.</u>**

ඉහත 5 සහ 6 වැනි පියවර වලට සමගාමීව ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙතින් ඉඩමේ සැලැස්ම ලැබීමෙන් පසුව ඉඩම තක්සේරු කර තක්සේරු වාර්තාව එවන ලෙස මෙම දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන තක්සේරුකරුට (අදාල දිස්ත්‍රික් කාර්යාලයට) යවනු ලැබේ. තක්සේරු වාර්තාවේ පිටපතක් ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන ලෙස දන්වනු ලැබේ .

**VIII. 8 <u>වැනි පියවර - ඉඩමේ කායික භුක්තිය භාරදීමට හා බදු අයකිරීමට දැන්වීම</u>**

ගරු ඇමතිතුමාගේ අනුමැතිය ලැබීමෙන් පසුව ගැසට් නිවේදනය පළකර නියමිත කාලය ඉකුත්වීමෙන් පසුව ඉඩමේ කායික භුක්තිය භාරදීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත පළාත් ඉඩම් කොමසාරිස්ට පිටපතක් සහිතව දන්වා යවනු ලැබේ. ඒ සමගම තක්සේරු වාර්තාව ලැබීමෙන් පසුව බදු අයකර මා වෙත වාර්තා කරන ලෙසද උපදෙස් යවනු ලැබේ. පළාත් ඉඩම් කොමසාරිස්ගේ නිර්දේශය පසුව ලැබීමට යටත්ව අනුමැතිය ලබා දී තිබුණේ නම් එම නිර්දේශය ලබා ගැනීමෙන් පසුව මෙම පියවරේ කටයුතු ක්‍රියාත්මක කරනු ඇත.

**IX. 9 <u>වැනි පියවර - ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩමේ කායික භුක්තිය භාරදීම හා බදු අයකිරීම</u>**

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් අනුව ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩමේ කායික භුක්තිය සංයෝජක වෙත භාර දී තක්සේරුව අනුව බදු අයකර ආපසු වාර්තා කළ යුතුයි.

**X. 10 <u>වැනි පියවර - බදු ඔප්පුව / දීමනාපත්‍රය සකස් කර අත්සනට යැවීම.</u>**

ඉහත 8 වැනි පියවරට සමගාමීව බදු ඔප්පුව හෝ දීමනා පත්‍රය (දීමනාපත්‍රයක් නම් අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය ලැබීමෙන් පසුව) සකස් කර බදුකරුගේ අත්සන ලබාගෙන අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිරූප අත්සන තැබීම සඳහා ජනාධිපති ලේකම් වෙත යවනු ලැබේ.

**XI. 11 <u>වැනි පියවර - බදු ඔප්පුව / දීමනාපත්‍රය ලියාපදිංචි කිරීමට යැවීම.</u>**

ජනාධිපති ලේකම් විසින් බදු ඔප්පුව/දීමනාපත්‍රය අතිගරු ජනාධිපතිතුමාගේ අත්සන තබා එවීමෙන් පසුව සහ නියමිත බදු අයකළ බවට ප්‍රාදේශීය ලේකම්ගෙන් වාර්තා එවීමෙන් පසුව ලියාපදිංචි කිරීම සඳහා අදාල දිස්ත්‍රික් රෙජිස්ටාර් වෙත මෙම දෙපාර්තමේන්තුවෙන් යවනු ලැබේ. එය ලියා පදිංචි කර සෘජුවම අදාළ ප්‍රාදේශීය ලේකම් වෙත යවන ලෙස ද උපදෙස් දෙනු ලැබේ.

**XII. 12 <u>වැනි පියවර - ලියාපදිංචි කළ බදු ඔප්පුව/ දීමනා පත්‍රය ප්‍රාදේශීය ලේකම් වෙත එවීම.</u>**

දිස්ත්‍රික් රෙජිස්ටාර් විසින් ලියාපදිංචි කරන ලද බදු ඔප්පුව/ දීමනා පත්‍රය සෘජුවම ප්‍රාදේශීය ලේකම් වෙත එවිය යුතුයි.

**XIII.** __13 වැනි පියවර - බදු ඔප්පුව/දීමනා පත්‍රය ආයෝජකයා වෙත භාර දීම__

බදු ඔප්පුව හෝ දීමනා පත්‍රය ලියාපදිංචි කර එවීමෙන් පසුව ප්‍රාදේශීය ලේකම් විසින් අදාළ ආයෝජකයා වෙත භාර දිය යුතුයි.

මෙම එක් එක් වැඩ පියවර අනුගමනය කිරීමේදී අදාළ ආයතන වල නියමිත නිලධාරීන් විසින් වැඩ පියවර අතර නිරර්ථක කාලයක් ඇති නොවන සේ කටයුතු කිරීම සඳහා මනා සම්බන්ධීකරණයක් පවත්වා ගත යුතුයි.එසේ දැඩි අවධානයක් සහිතව ක්‍රියා කිරීම තුළින් මෙම සම්පූර්ණ ක්‍රියාවලිය සඳහා විශේෂිත අවස්ථාවකදී හැර මාසයක පමණ කාලයක් වැය වෙතැයි අපේක්ෂා කෙරේ.මෙම ක්‍රියා පටිපාටිය අනුව මින් ඉදිරියට මෙයට අදාළ ඉල්ලීම් සම්බන්ධයෙන් නොවලහා ක්‍රියා කරන මෙන් කාරුණිකව දන්වමි.මෙම වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීමේදී යම් ගැටළුකාරී අවස්ථාවක් පැන නැගුණහොත් මා හෝ ඉඩම් කොමසාරිස් (ඉඩම්) පී.බී.අයි.එල්. විජේගුණවර්ධන මිය (දුරකථන -0112875834 ෆැක්ස් - 0112873110) විමසන ලෙසද දන්වමි.

ආර්.පී.ආර්. රාජපක්ෂ,
ඉඩම් කොමසාරිස් ජනරාල්.

__පිටපත්:-__

1. ජනාධිපති ලේකම් - අ.ක.ස.
2. අග්‍රාමාත්‍ය ලේකම් - කා.දැ.පි.
3. ලේකම්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය - අ.ක.ස.
4. ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය - කා.දැ.පි.
5. ලේකම්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - අ.ක.ස.
6. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - අ.ක.ස.
7. සියළුම රේඛීය අමාත්‍යාංශ ලේකම්වරුන් - අ.ක.ස.
8. සියළුම ප්‍රධාන ලේකම්වරුන් - කා.දැ.පි.
9. රෙජිස්ට්‍රාර් ජෙනරාල් - අ.ක.ස.
10. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් - කා.දැ.පි.
11. සියළුම අන්තර් පළාත් නියෝජ්‍ය/සහකාර ඉඩම් කොමසාරිස්වරුන් - අ.ක.ස.
12. ඉඩම් කොමසාරිස් (ඉඩම්) - අ.ක.ස.